තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2026/2027

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලබන NVQ 5 මට්ටමේ ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්ත ව සිටින්නන්ට වයස් සීමාව 45 ට නොවැඩි විය යුතු ය. අමතර සුදුසුකම් ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

1.1 අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය/ අංක ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06න් සම්මාන 03ක් සහිතව සමත් විය යුතු ය. තව ද, ඔහු හෝ ඇය,

(අ) පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසලක යටත් පිරිසෙන් මාස 06 පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

හෝ

(ආ) ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

හෝ

(ඇ) පාසල් ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙන් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම;

හෝ

(ඈ) කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු විය යුතු අතර කිසියම් ජාත්‍යන්තර තරගයකට සහභාගී වී තිබීම;

හෝ

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ ද්ස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම. එසේ නැතහොත් ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයක දී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතු ය.

1.2. ආදර්ශ අයදුම්පත හා නොගැලපෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. අයදුම්පත් එවීමේ ක්‍රමය :

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි "8x13$^{1}/_{3}$" ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර **2026.12.01 වන දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නියමිත ආකෘතිය ප්‍රකාර ව සම්පූර්ණ නො කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ **"2026/2027 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කර එවිය යුතු ය.

2.3 රජයේ සේවය, පළාත් රාජ්‍ය සේවය සහ සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු ය. එසේ නොවන අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. තෝරා ගැනීම :

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත් අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චිත කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

4. පාඨමාලාව පිළිබඳ විස්තර :

4.1 විෂය නිර්දේශය පහත පරිදි කොටස් 05 කින් සමන්විත වේ.

(අ) *පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත*
ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණු වීම් ක්‍රම, සැලසුම්

ක්‍රම භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම සහ වාචික පරීක්ෂණයකින් සමන්විත වේ.

(*ආ*) අවම වශයෙන් ක්‍රීඩා 10 ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම

(*ඇ*) ජවන හා පිටිය මළල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(*ඈ*) ජවන හා පිටිය මළල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථානෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය.

(*ඉ*) ක්‍රීඩා කායික විද්‍යාව, ක්‍රීඩා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලන, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා මනෝවිද්‍යාව වැනි පොදු විෂයයන් පිළිබඳ දැනුම.

4.2 පාඨමාලාවේ කාලසීමාව මාස 12 කි.

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් රු. 60,000.00ක මුදලක්, ලදුපතේ ගිණුම් හිමියාගේ නම ලෙස **''ලේකම්, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය"** හා තැන්පතුවේ අවශ්‍යතාවය වශයෙන් "NISS DIP 26/27 ලෙස සටහන් කර අංක 7040742 දරන ලංකා බැංකුවේ ටොරිංටන් ශාඛාව වෙත පාඨමාලා ගාස්තු වශයෙන් පාඨමාලාව ආරම්භ කිරීමට පෙර ගෙවා එම ලදුපතේ ඡායාරූපයක් diploma@miss.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු අතර එසේ සිදු නොකරන්නන්ගේ මුදල් පිළිබඳව ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වගකියනු නොලැබේ.

පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අපේක්ෂකයන් පමණි. එමෙන් ම මෙම මුදල වෙක්පතකින් ගෙවන්නේ නම් ආදායකයා ලෙස **''ලේකම්, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය"** යනුවෙන් සටහන් කළ යුතු ය. මෙම මුදල කුමන හේතුවක් නිසාවෙන් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් හට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නේවාසිකාගාර පහසුකම් ලබාගත හැකි අතර නේවාසිකාගාර ගාස්තුව වශයෙන් (පාඨමාලාව පවත්වනු ලබන වර්ෂයක කාල සීමාව සඳහා) රු. 18,000.00 ක මුදලක් අයකරනු ලැබේ. පාඨමාලාව සඳහා ලියාපදිංචිය සිදු කරන දින මෙම මුදල ගෙවිය යුතු වේ.

4.5 පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගනු ලබන අය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතු ය.

4.6 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා **"ක්‍රීඩා ඩිප්ලෝමා"** සහතික පත්‍රය ප්‍රදානය කරනු ලබන අතර NVQ 5 වාචික පරීක්ෂණයට පෙනී සිටීමෙන් අනතුරුව NVQ 5 සහතිකය ලබා ගැනීමට අවස්තාව හිමි වනු ඇත.

5. අනෙකුත් කොන්දේසි :

5.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබා දීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 පවතින ඉහළ ම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර සඳහන් කළ යුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද භාර ගනු නොලැබේ.

5.3 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

2026 ඔක්තෝබර් මස 28 වැනි දින,
100/7, නිදහස් මාවත,
කොළඹ 07.